# INSEE සිමෙන්ති වෙතින් ව්‍යාපාර හවුල්කරුවන්ට සම්මාන

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සිමෙන්ති නිෂ්පාදකයා වන INSEE සිමෙන්ති සමාගම '2022 වාර්ෂික ව්‍යාපාර හවුල්කරුවන්ගේ සම්මාන උළෙල' ඉතා උත්සවාකාරයෙන් සිනමන් බෙන්තොට බීච් හෝටලයේදී පසුගියදා පවත්වන ලදී. ඉහළ සත්කාර සහිතව පැවැත්වූ මෙම සම්මාන උළෙල සඳහා INSEE සිමෙන්ති සමාගම හා සම්බන්ධ දිවයින පුරා විසිරී සිටින ව්‍යාපාරික හවුල්කරුවන් සහභාගි විය. මෙම සම්මාන උළෙල සමාගමේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී, විධායක කමිටුව ඇතුළු කළමනාකාරිත්වයේ පූර්ණ අධීක්ෂණය හා අනුග්‍රහය මත පැවැත්වූ අතර විවිධ බාධක මධ්‍යයේ 2021 වර්ෂයේ විකුණුම් කාර්ය සාධනයන් ඉහළ නැංවූ ජාතික හා ප්‍රාදේශීය ව්‍යාපාරික හවුල්කරුවන් සම්මානයට පාත්‍ර කරන ලදී. කොවිඩ් මාර්ගෝපදේශයන්ට අනුකූලව සෞඛ්‍යාරක්ෂාව තහවුරු කරමින් සීමිත පිරිසක් සහභාගි වූ මෙම සම්මාන උළෙල INSEE සමාගම හා බැඳි සියලු ව්‍යාපාරික හවුල්කරුවන්ට අමතක නොවන රාත්‍රියක් විය. ව්‍යාපාරික හවුල්කරුවන්ගේ කාර්ය සාධනය සම්මානනීය තත්ත්වයට පත්කළ මෙම රාත්‍රිය ප්‍රසිද්ධ ගායක, ගායිකාවන්ගේ සහභාගිත්වයෙන් තවදුරටත් වර්ණවත් විය.

INSEE සිමෙන්ති ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ගුස්ටාවෝ නවාරෝ මහතා මෙම අවස්ථාවට සහභාගි වෙමින් ප්‍රකාශ කළේ "2021 වර්ෂය INSEE සිමෙන්ති සමාගම කුමන අභියෝගයකට වුව මුහුණදෙමින් ශක්තිමත්ව එය ජය ගැනීමට සූදානම්ව සිටි බවයි. කලාපය පුරා INSEE පහසුකම්වලින් සමන්විත බහුජාතික පාරිසරික පද්ධතියකින් හා ශක්තිමත් ව්‍යාපාරික හවුල්කාර ජාලයක් හරහා එය වඩා දුරදර්ශී දැක්මක් සහිතව ඉදිරියට ගෙනගිය බවයි. එම තත්ත්වය තුළ 2022 වර්ෂය වඩා ඵලදායී ප්‍රවේශයක් කරා ගමන් කළ හැකි බවත්ය."



# ජාතික වගකීම ඉටුකරමින් කාගිල්ස් "ගමෙන් ගෙදරට" වැඩසටහන 10 වැනි වරටත්

කොවිඩ් වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාව පුරා කෘෂිකාර්මික සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රජාවන්ට බොහෝ අභියෝගවලට මුහුණ දීමට සිදුවිය. මින් එක් ප්‍රධාන අභියෝගයක් වූයේ ඔවුන්ට වෙළෙඳපොළට ප්‍රවේශ වීමට අවස්ථාවන් අහිමි වීමයි. ඒ අනුව කාගිල්ස් සමාගම විසින් ගමෙන් ගෙදරට වැඩසටහන හඳුන්වා දෙන ලද්දේ මෙම ගැටලුවට පිළියමක් ලෙස මෙන්ම රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට විශාල පාරිභෝගික ජාලයක් සමඟ සම්බන්ධ වීමට වේදිකාවක් සලසා දීමේ අරමුණ ඇතිවයි.



මෙම වැඩසටහන කාගිල්ස් ෆුඩ් සිටි පරිශ්‍රයේ මාසික වෙළෙඳ ප්‍රදර්ශනයක් ලෙස පවත්වන අතර, එය 2020 වසරේ අග භාගයේදී ආරම්භ කරන ලදී. මෙහිදී තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වෙන් කරන ලද වෙළෙඳ කුටි හරහා ඔවුන්ගේ නිෂ්පාදන සෘජුවම පාරිභෝගිකයන්ට විකිණීමට අවස්ථාව හිමිවේ. ප්‍රදර්ශන කුටි, උපයෝගිතා, අලෙවිකරණය ඇතුළු මෙම වැඩසටහනට අදාළ සියලුම වියදම් කාගිල්ස් සමාගම විසින් දරනු ලැබේ. මේ වනවිට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 100කට අධික සංඛ්‍යාවක් මෙම වැඩසටහනට සහභාගි වී ඇත.

වෙළෙඳපොළ අවස්ථාවන් ලබාදීම සහ අමතර ආදායම් මාර්ගයක් ලබාදීමට අමතරව කාගිල්ස් සමාගම විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඇසුරුම්කරණය, ලේබල් කිරීම සහ තත්ත්ව සහතික කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික සහායද සපයන අතර කාගිල්ස් බැංකුව විසින් මෙම ව්‍යවසායකයන්ට අඩු වියදම් ණය යෝජනා ක්‍රම හරහා මූල්‍ය පහසුකම් සපයයි. තවද ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට තම නිෂ්පාදන කාගිල්ස් සමාගමෙහි ලැයිස්තුගත කර ගැනීමටද අවස්ථාවක් ලැබෙන අතර සමහර කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ශ්‍රී ලංකාවෙන් ඔබ්බට අපනයන වෙළෙඳපොළට තම නිෂ්පාදන අලෙවි කිරීමට වෙළෙඳපොළ අවස්ථා විවෘත කර දීමටද මෙම වැඩසටහන සමත් වී ඇත. ජාතික සංවර්ධනයට දායක විය හැකි ව්‍යවසායකයන්ට ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ගැනීම සඳහා සහාය වීමට කාගිල්ස් සමාගම කැපවී සිටී.

කාගිල්ස් සමාගම විසින් පවත්වන ලද 10 වන "ගමෙන් ගෙදරට" වැඩසටහන පෙබරවාරි 26 සහ 27 යන දෙදින තුළ කඩවත-3 කාගිල්ස් ෆුඩ් සිටි පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදී. මෙම 10 වැනි වැඩසටහනට ආයුර්වේද රූපලාවණ්‍ය නිෂ්පාදන, පොල්තෙල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන, කෝමාරිකා ජෙලි සහ අතුරුපස වර්ග, උක් ආශ්‍රිත නිෂ්පාදන, වේවැල් සහ පන් නිෂ්පාදනවල සිට සෙල්ලම් බඩු දක්වා ආකර්ෂණීය නිෂ්පාදන රැසක් ඇතුළත් විය. ඉදිරිපත් කර තිබූ නිෂ්පාදන මෙන්ම මෙම වැඩසටහන සඳහා පාරිභෝගිකයන්ගෙන් හොඳ ප්‍රතිචාරයක් ලැබිණි. තවද පාරිභෝගිකයන්ගේ පහසුව සඳහා මුදල් රහිත ගෙවීම් සිදු කිරීමට මෙහිදී මෑතකදී හඳුන්වා දුන් ලංකා QR (Lanka QR) f ගෙවීමේ පහසුකමද සපයා තිබිණි.

# SAMSUNG සිය නවතම ගැලැක්සි Devices නිර්මාණය කිරීම සඳහා ඉවතලන මාළු දැල් යොදා ගනී

සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස්, සාගර ආශ්‍රිත ප්ලාස්ටික් සඳහා නව ජීවයක් එක් කරමින් සිය එකිනෙකට වෙනස් වූ Galaxy devices නිෂ්පාදනය සඳහා නව අමුද්‍රව්‍යයක් නිපදවීමට පියවර ගෙන ඇත. ඒ තිරසර බව හා නවෝත්පාදනය එක් කළ ආයතනික පියවරක් ලෙසිනි. සාගර ආශ්‍රිතව ඇති ඉවත දැමූ ධීවර මාළු දැල් නැවත වෙනත් අරමුණක් සඳහා භාවිත කිරීමේ අරමුණින් (repurposed) මෙම නව අමුද්‍රව්‍ය නිපදවනු ලබයි. විශේෂයෙන් පරිසරය උදෙසා වූ Galaxy for the Planet යන අපගේ ගමන් මගේ තවත් පියවරක් වන මෙම අමුද්‍රව්‍ය භාවිතය තුළින් පාරිසරික හානිය අවම කිරීමටත් Galaxy පාරිභෝගිකයන් වෙත තිරසර ජීවන රටාවක් උරුමකර දීමටත් සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් අරමුණු කරයි.




සාගර ආශ්‍රිත ප්ලාස්ටික් භාවිත කර නිපදවන ලද අමුද්‍රව්‍ය ඉදිරියේදී සැම්සුන්හි සමස්ත නිෂ්පාදන මාලාවට ඇතුළත් කරනු ඇති අතර පසුගියදා පැවැති Unpacked හිදී එළිදක්වනු ලැබූ සැම්සුන්හි නවතම Galaxy devices සමඟින් එම වැඩපිළිවෙළ පිළිබඳව වැඩිදුර තොරතුරු අනාවරණය විය. එක් වරක් භාවිත කරන ලද ප්ලාස්ටික් පරිසරයෙන් ඉවත් කිරීමට මෙන්ම පාරිභෝගිකයන් භාවිත කර ඉවත දැමූ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය කර නිපදවන ලද ද්‍රව්‍ය (post-consumer material-PCM) හා ප්‍රතිචක්‍රීයකරණය කළ කඩදාසි වැනි වෙනත් පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතය තවදුරටත් ඉහළ නැංවීම සඳහා වන සැම්සුන්හි දැනට සිදුකරගෙන යනු ලබන ප්‍රයත්නය මෙම devices තුළින් මනාව ප්‍රදර්ශනය කරනු ඇත. මෙම සුවිශේෂී පරිවර්තනයත් සමඟ අනාගතයේදී devices තාක්ෂණය සමඟින් ප්‍රමුඛ නිර්මාණයන් පාරිභෝගිකයා වෙත ගෙන එනු ඇති අතරම වඩා යහපත් පාරිසරික බලපෑමක්ද එල්ල කරනු ඇත.

ඔබ සාගර ආශ්‍රිත ප්ලාස්ටික් පිළිබඳ සිතන විට සාගරය මතුපිට පාවෙන ප්ලාස්ටික් වතුර බෝතලයක් හෝ ග්‍රොසරි බෑගයක් පිළිබඳ සිතට නැගෙනු ඇත. අප සිතනවාට වඩා සුවිසල් පාරිසරික තර්ජනයක් සෑම වසරකම ඉවත ලන ධීවර මාළු දැල් ටොන් 640,000ක් ප්‍රමාණයක් සමඟ සිදුවෙයි.

පාරිසරික වශයෙන් පමණක් නොව Galaxy devices පරිශීලකයන්ගේද ජීවිත කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන ආකාරයේ සාගර ප්ලාස්ටික් දූෂණය අවම කිරීමට කැපවී සිටින සැම්සුන් මේ තුළින් නව තාක්ෂණික දියුණුව වෙනුවෙන් පාරිසරික ක්‍රියාකාරකම් යොදා ගැනීමට කටයුතු කර ඇත්තේ අනාගත පරපුර වෙනුවෙන් මිහිතලය ආරක්ෂා කිරීම සඳහා සමාගමෙහි කැපී පෙනෙන ජයග්‍රහණයක් සනිටුහන් කරමිනි.

ඔබ කොහේ, කොතැන සිටියත් ඔබට අවශ්‍ය සේවය ඕනෑම වේලාවක ලබාදීමට අප සූදානම්. Samsung Galaxy smartphone එකක් මිලදී ගැනීමට ඔබ තීරණය කර ඇත්නම් එයින් ඔබේ සිතට සැහැල්ලුවක් දැනෙනු ඇත. ගැටලු හඳුනා ගැනීමට හා ප්‍රශස්තකරණය සඳහා ඇති අන්තර් ක්‍රියාකාරී Samsung Members app එක මඟින් ඔබගේ දුරකථනයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට පහසු වන අතරම ඔබට අමතර සහායක් අවශ්‍ය වූ විට අපගේ උපකාරක සේවාව ඔබගේ ගැටලු නිරාකරණය කිරීමට සහාය ලබා දෙයි.

# SLT-MOBITEL වෙතින් මෙරට සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල සිහින බලගැන්වීමට සහ දියුණුවට සුවිශේෂී අත්වැලක්

ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදක වන SLT-MOBITEL මෙරට සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වෙනුවෙන් විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කර තිබේ. 'බලගන්වමු සිහින - ව්‍යාපාරයට සවිමත් සබැඳියාවක්' යනුවෙන් නම් කර ඇති මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වන්නේ ව්‍යාපාර ලෝකයේ වෙනස්කම්වලට හොඳින් අනුගත වෙමින් අඛණ්ඩව දියුණුව කරා යෑමට එම ව්‍යාපාරවලට අත්වැලක් වීමය.




SLT-MOBITEL මේ වනවිට ව්‍යාපාර ක්ෂේත්‍රය ඉලක්ක කරගෙන දුරකථන සේවා, අන්තර්ජාල සේවා, ව්‍යාපාරික යෙදවුම්, රූපවාහිනී සේවා හා Cloud තාක්ෂණ විසඳුම් ඇතුළු විසඳුම් හා සේවා රාශියක් හඳුන්වා දී තිබේ. මේ අතරින් Vobox, Voice Unlimited, Biztunes, SLTM Bizchat, SLTM e-Siphala, Business Internet Links, VPN Solutions, Akaza Solutions සහ PABX Solutions යනාදිය ප්‍රධාන තැනක් ගනී. මීට අමතරව සුළු හා මධ්‍යම පරිමාණ කාණ්ඩයේ ව්‍යාපාර වෙනුවෙන් තවත් විසඳුම් හා සේවා රාශියක් හඳුන්වා දීමට SLT-MOBITEL මේ වනවිට පියවර ගෙන ඇත.

2022 වසර සඳහා SLT-MOBITEL හි තේමාව වන #NoDreamTooBig යන්නට සමගාමීව නව ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර තිබේ. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට හොඳින්ම ගැළපෙන සම්බන්ධතා සේවා හා උපාංග පිරිනමමින්, එම ව්‍යවසායකයන්ට තම ව්‍යාපාරික සිහින සැබෑ කරගැනීමට අත්වැලක් සැපයීම මෙහි අරමුණයි.

තවද අදාළ ව්‍යාපාරවල අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් කළ විශේෂ පැකේජ එකතුවක් ද SLT-MOBITEL ආයතනය විසින් හඳුන්වා දී තිබේ. මාසික ගාස්තු රහිත පැකේජ, මූලික ගාස්තු කපාහැරීම, ඩිජිටල් අලෙවිකරණ දීමනා සහ තෝරාගත් නිෂ්පාදන හා සේවා සඳහා වට්ටම් පිරිනැමීම වැනි ප්‍රතිලාභ රාශියක් මෙම පැකේජවලට ඇතුළත්ය.

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව උදෙසා කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටුකරන බව SLT-MOBITEL විශ්වාස කරයි. මෙම ව්‍යාපාරවල කාර්යක්ෂමතාව හා තරගකාරිත්වය තවදුරටත් දියුණු කිරීම සඳහා විශ්වසනීය හා සුරක්ෂිත සම්බන්ධතා සහ ඩිජිටල් පදනම් අත්‍යවශ්‍ය වේ.

# Softlogic වෙතින් MAXMO වායුසමීකරණ යන්ත්‍රය ශ්‍රී ලාංකේය පාරිභෝගිකයන් අතට

Softlogic Holdings PLCහි පූර්ණ අනුබද්ධිත Softlogic Retail (Pvt) Ltd. මඟින්, මනා නිමාවකින් යුක්ත, විදුලි පිරිමැසුම්දායක, වායු සමීකරණ යන්ත්‍රයක් වන MAXMO වායු සමීකරණ යන්ත්‍රය, 2022 පෙබරවාරි 27 වැනි දින හඳුන්වා දුන් අතර දිවයින පුරා Softlogic හා Softlogic Max ප්‍රදර්ශනාගාරවලින් මෙන්ම අන්තර්ජාලය හරහා mysoftlogic.lk. වෙත පිවිසීමෙන්ද MAXMO වායු සමීකරණ යන්ත්‍රය මිලදී ගත හැකිය.




Softlogic Retail (Pvt) Ltd ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී මොහමඩ් රිස්වි මහතා අප හා අදහස් දක්වමින් මෙසේ ප්‍රකාශ කළේය: "MAXMO සන්නාමය ගෘහස්ථ උපකරණ සහ උපාංග සඳහා වඩාත් ජනප්‍රිය තේරීමක් ලෙසට තිරසාරව වර්ධනය වීම පාරිභෝගකයන් තුළ Softlogic කෙරෙහි ඇති විශ්වාසයට සාක්ෂියකි. සිල්ලර වෙළෙඳ අවකාශය තුළ, පුළුල් වපසරියක ව්‍යාප්ත ව්‍යාපාර සමඟින් අපි ශක්තිමත් සහ විශ්වාසවන්ත පාරිභෝගික සබඳතාවක් ගොඩනගාගෙන ඇති අතර අපගේ පාරිභෝගිකයන් සිය ජීවන රටාව ගොඩනගා ගැනීමේදී තෝරා ගන්නා සන්නාම අතරට අපව ඇතුළත් කර තිබීම සතුටට කරුණක්. MAXMO යනු මේ වන විට පාරිභෝගිකයන් අතර විශාල ආකර්ෂණයක් අත්කර ගෙන ඇති එවැනි සන්නාමයකි. අප ආයතනය දැනට MAXMO සන්නාමය යටතේ රෙදි සෝදන යන්ත්‍රවල සිට ඉතා කුඩා ගෘහ උපකරණ දක්වා පුළුල් පරාසයක ගෘහ උපකරණ සිල්ලරට අලෙවි කරන අතර MAXMO පවුලට නවතම එකතු කිරීම ලෙස MAXMO වායු සමීකරණ හඳුන්වාදීමට සතුටු වෙනවා."

# පැල්වත්ත කිරි සමාගමේ Most Creative Dish තේරීමේ තරගය මඟින් නත්තලේ නියම අර්ථය විදහා දක්වයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දේශීය කිරි නිෂ්පාදන සන්නාමයක් වන පැල්වත්ත කිරි නිෂ්පාදන සමාගම සිය විශ්වාසවන්ත ගනුදෙනුකරුවන්ට ප්‍රීතිමත්, වර්ණවත් සහ රසවත් නත්තලක් ලබා දීම සඳහා "Most Creative Dish"නමින් නත්තල තේමා කරගත් තරගයක් පවත්වන ලදී. දෙසැම්බර් 15 වැනි දින සිට 2021 දෙසැම්බර් 31 වැනිදා දක්වා තරගකරුවන් හට තරගය විවෘතව පැවතිණි. මෙම තරගය මඟින් තරගකරුවන් හට පැල්වත්ත කිරි ආශ්‍රිත නිෂ්පාදන උපයෝගී කරගනිමින් තම හැකියාවන් නත්තල තේමා කොටගනිමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා විය.

තරගයට ඉදිරිපත් වීමේ මාධ්‍යය පැල්වත්ත ෆේස්බුක් පිටුව වූ අතර අතුරුපස වර්ග සහ නත්තල් තේමාකොටගත් කෑම වර්ග සිය ගණනක් එහි පළවිය. පැල්වත්තේ විවිධ නිෂ්පාදන භාවිත කරමින් තරගකරුවන් ඔවුන්ගේ නිර්මාණශීලීත්වය ඉදිරිපත්කොට තිබිණි. නත්තල් සලකුණේ සිට නත්තල් කේක්, පුඩින්, කුකීස් සහ කිරි මඟින් තරගකරුවන් සිය හැකියාවන් එළිදක්වා තිබිණි. සමහර තරගකරුවන් ඒවා ඔවුන්ගේ නිවෙසේ නත්තල් සැරසිලි සමඟ ප්‍රදර්ශනය කොට තිබිණි.

දෙසැම්බර් මාසය විශේෂ වන්නේ නව කැලැන්ඩර වර්ෂය සහ නත්තල් සමය නිසාය. ඒ සමඟම අවට ඇති සියල්ල සැරසිලි, විදුලි පහන්, කැරොල් සහ කෑමවලින් පිරී යයි. වසරක සහ දෙකක කාලයක් තුළ ආහාර එකිනෙකා සමඟ බෙදා ගැනීමේ අදහස අවදානමක් වූ බැවින්, මෙම මුලපිරීම තුළින් අප සැවොම ආදරය කරන සහ භුක්ති විඳින එම නත්තලේ නියම අර්ථයට නැවත පණක් ලබා දීමට පැල්වත්ත මේ තරගය තුළින් උත්සහ කරන ලදී.

Scanned with CamScanner